**බස්නාහිර පළාත් සභාව - 2021 වර්ෂය**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

බස්නාහිර පළාත් සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(1) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පළාත් සභා පනතේ 23(2) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) උපවගන්තියේ විධිවිධාන ප්‍රකාර සම්පිණ්ඩන වාර්තාව 2022 දෙසැම්බර් 14 දින නිකුත් කරන ලද අතර ජාතික විගණන පනතේ 11(2) උප වගන්තිය ප්‍රකාර විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 ඔක්තෝබර් 31 දින නිකුත් කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව හා ජාතික විගණන පනතේ 10(1) උප වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙතද, වාර්තාවේ පිටපත 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(2) වගන්තිය ප්‍රකාරව පළාත් සභාව ඉදිරියේ තැබීම සඳහා ආණ්ඩුකාරවරයා වෙතද ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා වන පදනම ඡේදයෙහි දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර බස්නාහිර පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට බස්නාහිර පළාත් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පළාත් භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව බස්නාහිර පළාත්, පළාත් පාලන දෙපාර්තමේන්තුවට 2021 වර්ෂයේ අග්‍රිම ගෙවීම් රු.17,863,695,731 ක් වුවත්, පළාත් පාලන දෙපාර්තමේන්තුවේ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය අනුව අග්‍රිම ලැබීම් රු.17,760,927,881 ක් වූයෙන් රු.102,767,850 ක වෙනසක් විය. | 2022 වර්ෂයේ සිට අග්‍රිම ලැබීම්වලට ජ'නල් සටහන්වල වටිනාකමද ඇතුළත් කර කාර්යසාධන ප්‍රකාශය සැකසීමට කටයුතු කරන බව දන්වමි. | ගිණුම් ශේෂ සසඳා නිවැරදි ශේෂය ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2021 දෙසැම්බර් 31 දිනට බස්නාහිර පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ඉංජිනේරු කාර්යාංශය හා පළාත් පාලන දෙපාර්තමේන්තුව යන ආයතන 03 හි පළාත් සභා නිලධාරීන්ගේ අත්තිකාරම් පාලන ගිණුමේ ශේෂය රු.175,778,114 ක් වුවද එදිනට එකී ආයතනවල කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ එකතුව | ණය ශේෂ නිවැරදි කර ගැනීමට කටයුතු සිදු කරමින් පවතී. | ගිණුම් ශේෂ සසඳා නිවැරදි ශේෂය ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | රු.170,231,084 ක් වීමෙන් රු.5,547,030 ක වෙනසක් පැවතුණි. | | |
| (ඇ) | 2021 දෙසැම්බර් 31 දිනට බස්නාහිර පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පොත් අනුව ගිණුම් අංක 6001, 6002 හා 6003 දරන පොදු තැන්පත් ගිණුම්වල එකතු ශේෂය රු.7,167,584ක් වුවද, එදිනට පළාත් භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව එකතු ශේෂය රු.6,949,087 ක් වීමෙන් ශේෂයන් අතර රු.218,497 ක වෙනසක් පැවතුණි. | ශේෂ නිරවුල් කිරීම සඳහා මේ වනවිට ඉදිරි කටයුතු සිදු කරමින් පවතී. | ගිණුම් ශේෂ සසඳා නිවැරදි ශේෂය ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | කොළඹ, පාලින්දනුවර, මතුගම, තිඹිරිගස්යාය, කැළණිය හා මීරිගම යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06 හි ගිණුම් අනුව (පළාත් සභා ප්‍රතිපාදනවලට අදාළ) පොදු තැන්පත් ශේෂය රු.30,116,831 ක්වූ අතර පළාත් අරමුදල් ගිණුමට අනුව එම කාර්යාල 06 හි පොදු තැන්පත් ශේෂය රු.30,744,229 ක් වීමෙන් රු.627,398 ක වෙනසක් විය. | එම වෙනස්කම් හඳුනා ගනිමින් සැසඳීම් සිදු කෙරෙමින් පවතී. | ගිණුම් ශේෂ සසඳා නිවැරදි ශේෂය ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේදී වෙනත් වැය ශීර්ෂ විසින් බස්නාහිර පළාත්, පළාත් පාලන දෙපාර්තමේන්තුවේ වැය ශීර්ෂයට හර කර තිබූ රු.4,469,164 ක වියදම් දෙපාර්තමේන්තුව විසින් ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරියේදී වෙනත් වැය ශීර්ෂ විසින් සිදුකර තිබෙන හර කිරීම්ද ඇතුළත් කිරීමට කටයුතු සිදුකරන බව දන්වමි. | වෙනත් වැය ශීර්ෂ විසින් දෙපාර්තමේන්තුව හරකර තිබෙන වියදම් දෙපාර්තමේන්තුව විසින් ගිණුම්ගත කළ යුතුය. |
| (ඊ) | බස්නාහිර පළාත්, පළාත් පාලන දෙපාර්තමේන්තුවේ 2021 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයට අනුව පළාත් සභා නිලධාරීන්ට අත්තිකාරම් ගෙවීම් රු.18,463,407 ක් වුවත් පළාත් සභා නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම අනුව එය රු.17,944,536 ක් වූයෙන් ශේෂයන් අතර රු.518,871 ක වෙනසක් විය. | ඉදිරියේදී ගිණුම් සාරාංශ මඟින් දෙපාර්තමේන්තු අතර සිදුකර ඇති හර කිරීම්ද ඇතුළත් කිරීමට කටයුතු කරන බව දන්වමි. | ගිණුම් ශේෂ සසඳා නිවැරදි ශේෂය ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (උ) | 2018 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා මාර්ග සංවර්ධන අධිකාරිය(බ.ප.) හා තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන අධිකාරිය(බ.ප.) මිලදීගෙන තිබූ රු.528,985,774 ක් වටිනා මූල්‍ය නොවන වත්කම්ද රු.28,998,824 ක් වටිනා තොරතුරු තාක්ෂණ උපකරණද ඉංජිනේරු කාර්යාංශයේ වත්කම් ලෙස හෝ ඒවා මාරු කිරීම් මඟින් ලබාදුන් ආයතන විසින් හෝ සමාලෝචිත වර්ෂය අවසානයටත් ගිණුම්ගත කර නොතිබුණි. | 2022 වර්ෂයේදී ඉදිරි කටයුතු සිදුකරන බව දන්වමි. | මිලදී ගන්නා ලද සියළු මූල්‍ය නොවන වත්කම් හා තොරතුරු තාක්ෂණ උපකරණ ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඌ) | බස්නාහිර පළාත් ඉංජිනේරු කාර්යාංශයේ සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශනවල සමාලෝචිත වර්ෂය අවසානයට | ඉදිරියේදී විසර්ජන ගිණුම් සකස් කිරීමේදී මෙවැනි ගණුදෙනු නිවැරදිව සටහන් | ගිණුම් ශේෂ සසඳා නිවැරදි ශේෂය ගිණුම්ගත කිරීමට |

| | | | |
|---|---|---|---|
| | නිරවුල් නොකළ අග්‍රිම ශේෂවල එකතුව රු.27,252,674 ක් ලෙස දක්වා තිබුණද එදිනට පළාත් අරමුදල් ගිණුමේ එකී ශේෂවල එකතුව රු.20,560,679 ක් වීමෙන් රු.6,691,995 ක වෙනසක් විය. | කිරීමට අවශ්‍ය උපදෙස් ලබාදෙන ලදී. | කටයුතු කළ යුතුය. |
| (එ) | බස්නාහිර පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ අංක 20.03.02.24 දරන ආදායම් ගිණුමට අනුව සමාලෝචිත වර්ෂයේ ආදායම් රැස්කිරීම රු.6,111,191 ක් වුවත් පළාත් භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව එය රු.5,877,191 ක් වීමෙන් රු.234,000 ක වෙනසක් විය. | රු.234,000 ක් සටහන් නොවීම නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. | ගිණුම් ශේෂ සසඳා නිවැරදි ශේෂය ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඒ) | 2021 දෙසැම්බර් 31 දිනට බස්නාහිර පළාත් අරමුදල් ගිණුම අනුව මූල්‍ය නොවන වත්කම් එකතුව රු.18,457,896,704 ක් වුවද අමාත්‍යාංශ /දෙපාර්තමේන්තු ගිණුම් අනුව එම මුළු වත්කම් එකතුව රු.21,988,970,384 ක් වූයෙන් රු.3,531,073,680 ක වෙනසක් විය. | සියලු වත්කම් ගිණුම්ගත කිරීම 2022 වර්ෂයේදී සම්පූර්ණ කිරීමට අපේක්ෂා කරන බව. | ගිණුම් ශේෂ සසඳා නිවැරදි ශේෂය ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඔ) | 2021 දෙසැම්බර් 31 දිනට බස්නාහිර පළාත් අරමුදල් ගිණුම අනුව වත්කම් අත්පත් කර ගැනීමේ වටිනාකම රු.1,863,453,587 ක් හා වත්කම් බැහැර කිරීම් හා මාරු කිරීම් වටිනාකම රු.141,052,838 ක් වුවද අමාත්‍යාංශ /දෙපාර්තමේන්තු ගිණුම් අනුව එම වටිනාකම් පිළිවෙලින් රු.1,869,437,828 ක් හා රු.139,545,535 ක් වීමෙන් රු.5,984,241 ක හා රු.1,507,303 ක වෙනසක් පැවතුණි. | 2022 වර්ෂයේදී නිවැරදි කිරීමට අපේක්ෂා කරන බව. | ගිණුම් ශේෂ සසඳා නිවැරදි ශේෂය ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඕ) | 2021 දෙසැම්බර් 31 දිනට බස්නාහිර පළාත් සභා ලේකම් කාර්යාලයේ රු.27,250,000 ක් වටිනා ජීප් රථයක්ද, පළාත් පාලන දෙපාර්තමේන්තුවේ රු.15,400,000 ක් වටිනා වාහන 02 ක් හා පළාත් සංචාරක මණ්ඩලයේ රු.166,000,000 ක් වටිනා ඒත්තුකාල ජල උද්‍යානය එකී ආයතන විසින් සිය මූල්‍ය ප්‍රකාශනවල හෝ පළාත් සභා අරමුදල් ගිණුමේ ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරියේදී ගිණුම්ගත කරන බව සඳහන් කරමි. | සියළු මූල්‍ය නොවන වත්කම් ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති වියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

පළාත් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම පළාත් භාණ්ඩාගාරය ඇතුළු ඒ ඒ ආයතනවල කළමනාකාරීත්වය විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව බස්නාහිර පළාත් සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.
- අවස්ථාවෝචිත උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස පළාත් සභාවේ අභ්‍යන්තර පාලනය සැලකිල්ලට ගන්නා නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය ඇගයීම.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම,

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව කළමනාකරණය දැනුවත් කරන ලදී.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.5.1 ශීර්ෂය 100 - ආණ්ඩුකාරවරයා

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ආණ්ඩුකාරවර කාර්යාලය යටතේ සැලසුම් අධීක්ෂණ ඒකකයක් පිහිටුවා ඒ සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.1,369,000 ක් වැය කර පරිගණක යන්ත්‍ර 05 ක් හා උපාංග මිලදී ගෙන තිබුණද ඒකකයට නිලධාරීන් තිදෙනෙකු පමණක් අනුයුක්ත කර තිබීම මත ඉතිරි පරිගණක යන්ත්‍ර 02 ක 2022 අගෝස්තු 31 දිනටත් ඌන උපයෝජිතව පැවතුණි. | ඉදිරියේදී ප්‍රයෝජනයට ගන්නා බව. | අවශ්‍යතාවය නිවැරදිව හඳුනාගෙන මිලදී ගැනීමට හා මිලදීගත් වත්කම් භාවිතයට ගත යුතුවේ. |
| (ආ) | 2020 ඔක්තෝබර් 22 දින සිදුවී තිබූ වාහන අනතුරක් රියදුරුගේ නොසැලකිල්ල මත සිදුවූ අනතුරක් වන බව තහවුරුවී තිබුණද මේ සම්බන්ධයෙන් තවදුරටත් අය කර ගැනීමට පැවති රු.281,584 ක ශේෂය අදාළ රියදුරුගෙන් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසානයටත් කටයුතු කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් නීතිමය කටයුතු සිදු කරමින් පවතින බව දන්වමි. | අලාභය වගකිව යුතු අයගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 1.5.2 ශීර්ෂය 101 - සභා ලේකම් කාර්යාලය

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2018 ඔක්තෝබර් 12 දිනැති අංක පීඑස්/සීඑස්ජී/11-18 දරන ජනාධිපති ලේකම්ගේ රාජ්‍ය වියදම් චක්‍රලේඛය ප්‍රකාර පළාත් සභා සභාපතිවරුන්ගේ කාර්යාලවල සේවයේ නියුක්ත කරවනු ලබන සහාය කාර්යය මණ්ඩලය රියදුරන් දෙදෙනෙකුද ඇතුළත් 10 දෙනෙකු විය යුතු නමුත් ඊට පටහැනිව බස්නාහිර පළාත් සභාවේ සභාපතිවරයාගේ සහාය කාර්යය මණ්ඩලය සඳහා රියදුරන් තිදෙනෙකු ඇතුළත්ව 11 දෙනෙකු යොදවා තිබුණු අතර වැඩිපුර යොදවා තිබුණු රියදුරු තනතුරක් සඳහා 2019 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා වැටුප් හා දීමනා වශයෙන් රු.1,343,912 ක් සභා ලේකම් කාර්යාලය විසින් ගෙවා තිබුණි. | පෞද්ගලික ලේකම් සඳහා රියදුරෙකු බඳවාගෙන ගෙවීම් කර ඇත. | චක්‍රලේඛයන්ට අනුගතව කටයුතු කළ යුතු අතර චක්‍රලේඛයෙන් බැහැරව කටයුතු කිරීමට විශේෂ අනුමැතියක් ලබාගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | | 2018 ජූලි 18 දිනැති අංක 03/2018 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ (1) ඡේදයට අනුව සහා ලේකම් කාර්යාලය විසින් 2004 අගෝස්තු 01 දින සිට නිලධාරීන්ට වැටුපට අමතරව ගෙවනු ලබන 1/3 ක දීමනාව සම්බන්ධයෙන් ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශ හා මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගත යුතු බව ඉතා පැහැදිලිව දක්වා තිබුණද එලෙස විධිමත් අනුමැතියක් ලබා නොගෙන 2019 මැයි සිට 2022 ජූනි දක්වා කාලය තුළ රු.11,019,607 ක මුදලක් නිලධාරීන් 30 දෙනෙකුට ගෙවීම් කර තිබුණි. | නිලධාරීන්ට දීමනා ලබාදීම සිදු කරන ලදී. | නිලධාරීන්ට වැටුපට අමතරව දීමනා ගෙවීමට පෙර ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ හා මුදල් කොමිෂන් සභාවේ නිර්දේශ සහ භාණ්ඩාගාර අනුමැතිය ලබාගත යුතුය. |
| (ඇ) | (i) | 2018 ඔක්තෝබර් 12 දිනැති අංක පීඑස්/සීඑස්ඒ/11-18 දරන ජනාධිපති ලේකම්ගේ රාජ්‍ය වියදම් කළමනාකරණ චක්‍රලේඛය ප්‍රකාරව පළාත් සභා සභාපතිවරයා සඳහා නිවාස කුලී දීමනාවක් ගෙවීම සඳහා ප්‍රතිපාදන සලසා නොතිබියදී 2020 හා 2021 වර්ෂ සඳහා මසකට රු.50,000 බැගින් එකතුව රු.1,200,000 ක නිවාස කුලී දීමනාවක්ද චක්‍රලේඛයේ සඳහන් නොවන සංග්‍රහ දීමනා ලෙස මසකට රු.2,000 බැගින් 2020 හා 2021 වර්ෂ සඳහා රු.48,000 ක් පළාත් සභාවේ සභාපති වෙත ගෙවා තිබුණි. | සභාපතිතුමාට වැටුප්/ දීමනා හා වෙනත් පහසුකම් ලබාදීම සිදු කරන ලදී. | අදාළ චක්‍රලේඛයට අනුගතව කටයුතු කළ යුතු අතර චක්‍රලේඛයෙන් බැහැර දීමනා ගෙවීම සඳහා විශේෂ අනුමැතියක් ලබාගත යුතුය. |
| | (ii) | බස්නාහිර පළාත් සභාවේ නිල කාලය 2019 අප්‍රේල් මාසයේ අවසන් වීමෙන් පසු, සභාව අක්‍රියව පැවති 2020 හා 2021 දක්වා කාල පරිච්ඡේදය තුළදී සභාපතිගේ පෞද්ගලික ලේකම් වෙත අතිකාල දීමනා ලෙස මාසිකව වැටුපට එකතු කර තිබූ රු.2,500 ක දීමනා සඳහා රු.60,000 ක්ද ඇතුළුව අනෙකුත් කාර්ය මණ්ඩලයට අතිකාල දීමනා ලෙස රු.401,618 ක් ගමන් වියදම් සඳහා රු.472,850 ක් වශයෙන් එකතුව රු.934,468 ක් ගෙවා තිබුණි. | සභාපතිතුමාට හා කාර්යය මණ්ඩලයට වැටුප් / දීමනා හා වෙනත් පහසුකම් ලබාදීම සිදු කරන ලදී. | පළාත් සභාවේ නිල කාලය අවසන්වී අළුත් පළාත් සභාවක් තේරී පත්වන තෙක් නාමික ධූරයක් බවට පත්වීම මත අදාළ චක්‍රලේඛය නිකුත් කර තිබූ ජනාධිපති ලේකම් විමසා ගෙවීම් පිළිබඳව පැහැදිලි කරගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (iii) | 2009 ජුනි 17 දිනැති අංක 09/2009(I) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 2(I) වගන්තිය ප්‍රකාර අමාත්‍ය කාර්ය මණ්ඩල, අමාත්‍යාංශ ලේකම්වරුන්, ආයතන ප්‍රධානීන් ඇතුළුව සියළුම රාජ්‍ය සේවකයින් තම සේවා ස්ථානයට පැමිණීම හා පිටවීම ඇඟිලි සලකුණු සටහන් කිරීමේ යන්ත්‍ර මගින් සනාථ කළ යුතු නමුත් පළාත් සභාවේ සභාපතිවරයාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයේ සාමාජිකයන් 11 දෙනෙකු එසේ ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතා කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2013 වර්ෂයේ කාර්යය මණ්ඩල සමාලෝචනයෙන් පසු සභා ලේකම් කාර්යාලයේ අනුමත කාර්යය මණ්ඩල වාර්තාව අනුව නීති නිලධාරී හා භාෂා පරිවර්තක තනතුරු ඉවත් කර තිබුණද නීති හා භාෂා පරිවර්තක ඒකකවල අනුයුක්ත නීති හා භාෂා පරිවර්තක නිලධාරීන් දෙදෙනෙකු සභා ලේකම් කාර්යාලයට තාවකාලිකව අනුයුක්ත කර එම ආයතනයේ වරප්‍රසාද හා දීමනා ලෙස 2019 මැයි සිට 2022 ජුනි දක්වා ¼ දීමනා ලෙස රු.1,224,764 ක මුදලක් ලබාදීමට කටයුතු කර තිබුණි. | 2013 වර්ෂයේ සිදු කරන ලද කාර්ය මණ්ඩල සමාලෝචනය මගින් එම තනතුරු මෙම කාර්යාලයේ අනුමත කාර්ය මණ්ඩයෙන් ඉවත් කර ප්‍රධාන ලේකම් කාර්යාලයේ නීති ඒකකයට හා භාෂා පරිවර්තක ඒකකයට ඇතුලත් කර ඇත. | සභා ලේකම් කාර්යාලයේ අනුමත කාර්යය මණ්ඩලයට ඇතුළත් නොවන තනතුරු සඳහා දීමනා ලබාදීම නොකළ යුතුය. |
| (ඉ) | ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව හෝ රජයට අයත් අමාත්‍යාංශයක හෝ ආයතනයක මැදිහත්වීමකින් හෝ ඉල්ලීමකින් තොරව බස්නාහිර පළාත් සභාවට සෘජු සම්බන්ධයක් නොමැති දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ සභාපති වෙත ඔහුගේ පෞද්ගලික ඉල්ලීමක් පදනම් කරගනිමින් රු.27,250,000 ක් වටිනා ප්‍රාඩෝ ජීප් රථයක් පළාත් ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය මත ලබාදී තිබුණි. | අදහස් දක්වා නොමැත. | ආයතනයේ සම්පත් උපරිම ඵලදායිතාවයකින් හා කාර්යක්ෂමතාවයකින් ආයතනයේ අරමුණු සඳහා පමණක් යොදාගත යුතු අතර විධිමත් අනුමැතියකින් තොරව බාහිර පාර්ශව වෙත ලබාදී ඇති වාහන කඩිනමින් ආපසු ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

### 1.5.3 ශීර්ෂය 102 - පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ 2021 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව සමාලෝචිත වර්ෂය තුළ පැවැත්වීමට නියමිත වූ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ, යෝග්‍යතා පරීක්ෂණ, දෙපාර්තමේන්තු පරීක්ෂණ සහ බඳවා ගැනීමේ විවෘත හා සීමිත තරඟ විභාග එකතුව 150 ක් වුවත් 2021 වර්ෂය තුළ පවත්වා තිබුණේ පරීක්ෂණ හා විභාග 48 ක් පමණි. | රටේ පැවති කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ කඩඉම් පරීක්ෂණ, යෝග්‍යතා පරීක්ෂණ, දෙපාර්තමේන්තු පරීක්ෂණ හා තරඟ විභාග පැවැත්වීම සීමා විය. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව ආයතනය කටයුතු කළ යුතු අතර එසේ නොමැති නම් ක්‍රියාකාරී සැලැස්ම සංශෝධනය කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.5.4 ශීර්ෂය 103 - සමූපකාර සේවක කොමිෂන් සභාව

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයට අදාළව කොමිෂන් සභාවට ලැබුණු අභියාචනා හා පැමිණිලි 77 කින් 41 ක් පමණක් විසඳා තිබුණි. | අභියාචනා හා පැමිණිලි සඳහා අදාළ වර්ෂයේදීම විසඳිය නොහැකි බව දන්වමි. | අභියාචනා හා පැමිණිලි කඩිනමින් විසඳීමට කටයුතු කළ යුතුය. |

### 1.5.5 ශීර්ෂය 104 - පළාත් පාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවහන සහ සංචාරක කටයුතු අමාත්‍යාංශය (බ.ප.)

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | පළාත් මුල්‍ය රීති 54.5, 54.6 ප්‍රකාර යම් අනතුරක් සම්බන්ධයෙන් පරිපූර්ණ වාර්තාවක් ඉදිරිපත් කිරීමට දවස් 07 කට වඩා ගත වෙතැයි අපේක්ෂා කරන්නේ නම් වහාම ප්‍රාරම්භක වාර්තාවක්ද, අලාභහානිය සිදුවූ දිනයේ සිට තුන් මසක් ඇතුළතදී පූර්ණ වාර්තාවක්ද ඉදිරිපත් කළ යුතු වුවත් බස්නාහිර පළාත්, පළාත් පාලන අමාත්‍යාංශයේ වාහන අනතුරු 03 ක් සිදුවී ප්‍රාරම්භක වාර්තා ඉදිරිපත් කිරීමට මාස 10 ත් 15 ත් අතර කාල පරාසයක්ද, පූර්ණ වාර්තා ඉදිරිපත් කිරීමට මාස 10 ත් වසර 02 ත් අතර කාල පරාසයක්ද ගත කර තිබුණි. | ඉදිරියේදී මෙවැනි අඩුපාඩු නොවීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි. | පළාත් මුල්‍ය රීති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ප්‍රධාන අමාත්‍ය නිල නිවස 2021 ජනවාරි 25 දින කුලී පදනම මත සංචාරක අමාත්‍යාංශය (මධ්‍යම රජය) වෙත ලබාදී තිබූ අතර ඉන් පසුව රු.2,223,000 ක පළාත් සභා ප්‍රතිපාදන වැයකර සූර්ය පැනල පද්ධතියක් සවිකර තිබුණි. නවීන පහසුකම් සහිත කොළඹ 07 හි පිහිටි එම නිල නිවාසය සඳහා රජයේ තක්සේරුවක් ලබා ගැනීමෙන් තොරව මසකට රු.16,000 ක් වැනි ඉතා අඩු කුලියකට ලබාදී තිබුණි. | නිල නිවාස පළාත් සභාව වර්තමානයේ භාවිතයට නොගන්නා නමුදු දීර්ඝකාලීන ආයෝජනයක් ලෙස සලකා සූර්ය පැනල සවි කිරීම කර තිබුණු බව දන්වමි. | නිල නිවාස පිටස්තර පාර්ශව වෙත කුලී පදනම මත ලබාදීමේදී රජයේ තක්සේරුවක් ලබාගෙන ඒ අනුව කටයුතු කළ යුතුය. |

**1.5.5.1 බස්නාහිර පළාත් ආර්ථික ප්‍රවර්ධන කාර්යාංශය**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | බස්නාහිර පළාත් ආර්ථික ප්‍රවර්ධන කාර්යාංශ ප්‍රඥප්තියේ 19(1) වගන්තිය ප්‍රකාරව කාර්යාංශ ප්‍රඥප්තියේ සඳහන් විධිවිධාන ක්‍රියාත්මක කිරීමට, බලාත්මක කිරීමට හා ගාස්තු අයකිරීමට රීති සකස් කර ආණ්ඩුකාරවරයා වෙතින් අනුමත කරවාගත යුතු වුවත් එවැනි රීති සකස් කර නොතිබුණි. | මූල්‍ය රීති සකසා අවසන් කර ඇති බවත් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම සඳහා ඉදිරිපත් කිරීමට නියමිත බවත් දන්වමි. | ප්‍රඥප්තිය ප්‍රකාරව නොපමාව රීති සකස් කර අනුමැතිය ලබාගත යුතුය. |
| (ආ) | 2020 දෙසැම්බර් 02 දින පුනරාවර්තන වියදම් සඳහා රු.20,000,000 ක් බස්නාහිර පළාත්, පළාත් පාලන අමාත්‍යාංශය විසින් කාර්යාංශයට ලබාදී තිබුණි. කාර්යාංශය විසින් මෙම මුදල අදාළ කාර්යයන්ට වියදම් කිරීමට ප්‍රථමයෙන් අමාත්‍යාංශයේ අනුමැතියකින් තොරව කාලීන තැන්පතුවල (Call Deposit) ආයෝජනය කර තිබූ අතර 2022 පෙබරවාරි 28 දින වනවිටද එම මුදලින් රු.9,338,752 ක් කාලීන තැන්පතුවල පැවතුණි. | එම මුදලින් සිදු කිරීමට අනුමත වූ කාර්යයන් සඳහා ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර නොතිබූ හෙයින් මෙම මුදල කාලීන තැන්පතුවල යෙදවිය. | පුනරාවර්තන වියදම් සඳහා ලබාදුන් මුදල අදාළ කාර්යයන්ට උපයෝජනය කර එමගින් අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | පළාත් භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගැනීමෙන් තොරව කාර්යාංශයේ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත පමණක් 2018 සිට 2021 වර්ෂය දක්වා "වෙස්ප්‍රෝ" ආරක්ෂක අංශ ව්‍යාපෘතියෙන් ප්‍රධාන විධායක | බස්නාහිර පළාත් සභාවේ 2010 අංක 09 දරන ආර්ථික ප්‍රවර්ධන කාර්යාංශ ප්‍රඥප්තියේ (15ඇ) සාමාන්‍ය බලතල යටතේ, කාර්යාංශයේ සේවකයන්ගේ පාරිශ්‍රමික | දීමනා ගෙවීමට අදාළ නිසි අනුමැතීන් ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | නිලධාරී ඇතුළු නිලධාරීන් 04 දෙනෙකුට ව්‍යාපෘති අධීක්ෂණ දීමනා ලෙස රු.2,988,690 ක් ගෙවා තිබුණි. | ගෙවීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත බලය පැවරී ඇත. | |
| (ඇ) | "වෙස්ප්‍රෝ" කාර්යාලීය පරිශ්‍ර ආශ්‍රිත සෞඛ්‍ය සේවා ව්‍යාපෘතියේ සේවාවන් සැපයීම වෙනුවෙන් ව්‍යාපෘති දීමනාවක් ලෙස 2018 සිට 2021 වර්ෂය දක්වා රු.5,380,400 ක් ප්‍රධාන විධායක නිලධාරී ඇතුළු කාර්යාංශයේ නිලධාරීන් 17 දෙනෙකුට පළාත් භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගැනීමෙන් තොරව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත පමණක් ගෙවා තිබුණි. | බස්නාහිර පළාත් සභාවේ 2010 අංක 09 දරන ආර්ථික ප්‍රවර්ධන කාර්යාංශ ප්‍රඥප්තියේ (15ඇ) සාමාන්‍ය බලතල යටතේ, කාර්යාංශයේ සේවකයන්ගේ පාරිශ්‍රමික ගෙවීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත බලය පැවරී ඇත. | දීමනා ගෙවීමට අදාළ නිසි අනුමැතීන් ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් බස්නාහිර පළාත් ආර්ථික ප්‍රවර්ධන කාර්යාංශයේ පිරිවැය රු.7,267,401 ක්වූ ජංගම නොවන වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණද, තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. | 2022 වර්ෂයේදී අදාළ සියළු වත්කම් ප්‍රත්‍යාගණනය සිදුකර අවසන් කරන බව දන්වමි. | තවදුරටත් ප්‍රයෝජනයට ගන්නා සම්පූර්ණයෙන් ක්ෂය කර අවසන් සියළු වත්කම් ප්‍රත්‍යගණනය කළ යුතුය. |

**1.5.5.2 බස්නාහිර පළාත් සංචාරක මණ්ඩලය**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මණ්ඩලයේ සභාපති වෙතින් රු.7,910,000 ක මුදලක් අයකර ගැනීම සම්බන්ධයෙන් මීගමුව දිසා අධිකරණයේදී පවරා තිබූ ඒත්තුකාල වෙරළ උද්‍යානයට අදාළ නඩුව සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශන මඟින් අනාවරණය කර නොතිබුණි. | 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී සංචාරක මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශ මඟින් හෙළිදරව් කිරීමට කටයුතු කරමි. | ආයතනයට එරෙහිව පවතින නඩු සම්බන්ධ තොරතුරු මූල්‍ය ප්‍රකාශන මඟින් අනාවරණය කළ යුතුය. |
| (ආ) | මණ්ඩලයේ සංචාරක ප්‍රවර්ධන කටයුතු සඳහා කෙටි වීඩියෝ පටයක් නිර්මාණය කිරීම සඳහා 2018 දෙසැම්බර් 31 දින බස්නාහිර පළාත්, පළාත් පාලන අමාත්‍යාංශය වෙතින් රු.1,636,445 ක් ලැබී තිබූ අතර 2022 අප්‍රේල් මස වන තෙක් එම වීඩියෝ පටය නිර්මාණය කර නොතිබුණි. එම මුදල 2018 වර්ෂයේ සිට ගෙවිය යුතු වියදමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණද පළාත් සභා සංවර්ධන ව්‍යාපෘතියකට ලැබූ මෙම මුදල්, අදාළ ව්‍යාපෘතිය සඳහා යොදා නොගෙන වසර 03 ක් තිස්සේ | ගෝලීය සංචාරක ප්‍රවර්ධනයට අනුකූලව මේ වනවිට වීඩියෝ පටයේ කටයුතු සිදු කරමින් පවතී. | සංවර්ධන ව්‍යාපෘති සඳහා ලැබූ මුදල් නොපමාව එම කාර්යය සඳහා යොදාගත යුතුය. |

ඌන උපයෝජිතව බැංකු ජංගම ගිණුමේ රඳවාගෙන තිබුණි.

**1.5.6 ශීර්ෂය 105 - සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු අමාත්‍යාංශය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අමාත්‍යාංශයේ ප්‍රයෝජනය සඳහා 2017 ජුනි 30 දින සිට කුලී පදනම මත වාහන 02 ක් ලබාගෙන සමාලෝචිත වර්ෂය තුළ වාහන කුලී ලෙස රු.4,263,840 ක් ගෙවා තිබුණි. එසේ තිබියදී අමාත්‍යාංශය සතු රු.34,985,000 ක වටිනාකමැති ලෑන්ඩ් රෝවර් වර්ගයේ ඩිස්කවරි ජීප් රථයක් 2021 අගෝස්තු 06 දින සිට බාහිර පාර්ශවයකට ලබා දී තිබුණි. | අදහස් දක්වා නොමැත. | ආයතනයේ සම්පත් උපරිම ඵලදායිතාවයකින් හා කාර්යක්ෂමතාවයකින් ආයතනයේ අරමුණු සඳහා පමණක් යොදා ගත යුතු අතර වෙනත් බාහිර පාර්ශව වෙත ලබා දී ඇති ආයතනය සතු වාහන කඩිනමින් ආපසු ලබාගැනීමට කටයුතු කළ යුතුය. |

**1.5.7 ශීර්ෂය 106 - කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන අමාත්‍යාංශය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| බස්නාහිර පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ ටින් මාළු ව්‍යාපෘතියක් සඳහා අවශ්‍ය යන්ත්‍ර හා උපකරණ මිලදී ගැනීමට 2020 හා 2021 වර්ෂයේදී රු.19,420,194 ක් වැයකර තිබූ අතර ටින් මාළු ව්‍යාපෘතියට අදාළ කර්මාන්ත ශාලාවේ ඉදිකිරීම් කටයුතු සමාලෝචිත වර්ෂය අවසානයටත් නිමකර නොතිබීම හේතුවෙන් එම යන්ත්‍ර හා උපකරණ ඌන උපයෝජිතව පැවතුණි. | 2022 වර්ෂයේදී නිෂ්පාදන කටයුතු ආරම්භ කරන බව දන්වමි. | 2020 දෙසැම්බර් මස සිට ඌන උපයෝජිතව පවතින මෙම වත්කම් කඩිනමින් අදාළ කාර්යයන්ට යොදාගත යුතුය. |

**1.5.7.1 කෘෂි සේවා අධිකාරිය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| බොජුන්හලක් හා අලෙවිසැල් 02 ක පිළිවෙලින් රු.461,870 ක්, රු.4,073,481 ක් හා රු.3,344,099 ක්වූ අවසාන තොග සත්‍යාපනය නොකිරීම ඇතුළුව එකතු | අවසාන තොග සත්‍යාපනය කිරීමට හා ගණුදෙනු සටහන් කිරීමට ලෙජරයක් පවත්වාගෙන යාමට කටයුතු | දෙසැම්බර් 31 දිනට වූ තොග සත්‍යාපනය කළ යුතු අතර ගණුදෙනු |

| | | |
|---|---|---|
| වටිනාකම රු.27,936,701 ක්වූ ගනුදෙනු විගණනය කිරීම සඳහා ලිඛිත සාක්ෂි ඉදිරිපත් නොකිරීම සහ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ගනුදෙනු සටහන් කිරීමට ලෙජරයක් පවත්වා නොතිබීම වැනි වැදගත් නිරීක්ෂණ හේතුවෙන් අධිකාරියේ 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතය ව්‍යාවනය කිරීමට සිදුවී තිබුණි. | කරන බව දන්වමි. | සටහන් කිරීමට ලෙජරයක් පවත්වාගෙන යා යුතුය. |

**1.5.8 ශීර්ෂය 107 - මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත සහ ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශය**

---

**1.5.8.1 පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය**

---

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2011 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ අනුමත ප්‍රතිපාදන මත ඉටු කරන ලද මාර්ග සංවර්ධන හා අනෙකුත් ඉදිකිරීම්වලට අදාළව අධිකාරියට ලැබිය යුතුව තිබුණු රු.4,739,664,970 ක් වූ මුදලින් 2022 අගෝස්තු 22 දින වනවිට වසර 08 කට වැඩි කාලයක් ඉක්මගොස් තිබුණද තව දුරටත් මහා භාණ්ඩාගාරයෙන් රු.2,145,797 ක් ලැබිය යුතුව පැවතුණි. | අධිකරණ ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය අනුමැතීන් සඳහා යොමුකර ඇත. | අයවිය යුතු මුදල් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | අධිකාරියට පවරා ඇති මුල් පැවරුම් වටිනාකමක් නොමැති පර්චස් 1,698.3 ක ඉඩම් කොටස් 17 ක් අධිකාරිය විසින් ඵලදායී ලෙස භාවිතා කිරීමට, නියාමනය කිරීමට කටයුතු කර නොතිබූ අතර එයින් අනවසර පදිංචිකරුවන් පරිහරණය කරමින් තිබූ පර්චස් 1,173.1 ක් වූ ඉඩම් කොටස් 12 ක් සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අනවසර පදිංචිකරුවන්ට අවශ්‍ය ඉඩම් කොටස් ලබාදී ඉතිරි කොටස් අධිකාරියට පවරා ගැනීමට කටයුතු කරමින් පවතී. | ඉඩම් කොටස් නිරවුල් කර ගැනීමෙන් අනතුරුව ඵලදායීව භාවිතා කළ යුතුය. |
| (ඇ) | වර්ෂ 20 කට පමණ අධික කාලයක සිට අස්ථානගත වී තිබූ වාහන 06 ක් පිළිබඳ විමර්ශන කටයුතු අවසන් කර එකී වාහන යලි පළාත් සභාවට ලබාගැනීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | කමිටුවක් පත්කර වාර්තාවක් ලබා ගැනීමට කටයුතු කරමින් පවතී. | විමර්ශන කටයුතු කඩිනමින් අවසන් කර වත්කම් පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2012 හා 2013 වර්ෂවලදී රු.17,577,120 ක් වූ ඇස්පෝල්ට් ටොන් 1,204.20 ක් ණය පදනම යටතේ අධිකාරියට අයත් නොවන මාර්ග ඉදිකිරීම් සඳහා විධිමත් අනුමැතියකින් තොරව කොන්ත්‍රාත්කරුවකුට ලබා දී තිබුණි. එයින් රු.9,533,413 ක මුදලක් අයකර ගැනීමට වසර 08 කට අධික කාලයක් ගතවී තිබුණද සක්‍රීය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මෙම මුදල අයකර ගැනීමට නීතිමය පියවර ගැනීමට කටයුතු කරමින් පවතී. | අයවිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.5.8.2 බස්නාහිර පළාතේ මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අධිකාරිය විසින් 2021 දෙසැම්බර් 31 දිනට සාමාන්‍ය මගී සේවා අවසරපත්‍ර 5,813 ක් නිකුත් කර තිබුණු අතර එයින් 5,584 ක අවසරපත්‍ර ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කිරීමෙන් තොරව ලබාදී තිබුණි. | 2007 ට පෙර ලබාදී ඇති බස්රථ සඳහා ටෙන්ඩර් ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණි. | ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කිරීමෙන් මගී සේවා අවසර පත්‍ර නිකුත් කළ යුතුය. |
| (ආ) | 1996 මාර්තු මස 27 දින අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 96/0552/118/033 මගින් බස්නාහිර පළාත් සභාවට බස් නැවතුම්පොලවල් 18 ක් පවරාදී තිබූ නමුත් 2022 මාර්තු 09 දින වන විටත් ඒවායේ නෛතික හිමිකම අධිකාරියට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | පැවරුම් සහතිකය හෝ ලියවිල්ලක් ලබාදෙන ලෙස දන්වා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ලිපි යොමුකර ඇත. | බස් නැවතුම්පළවල නෛතික හිමිකම පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | අධිකාරිය සඳහා තොරතුරු තාක්ෂණය මත පදනම් වූ පරිගණක ජාලය ස්ථාපනය කිරීම සහ සැලසුම් කිරීම සඳහා 2006 සිට වසරක කාලයක් සඳහා කොළඹ විශ්වවිද්‍යාලයේ පරිගණක අධ්‍යයන ආයතනය සමඟ ගිවිසුම්ගත වී තිබූ අතර පරිගණක උපකරණ හා මෘදුකාංග වෙනුවෙන් අධිකාරිය විසින් 2006 වර්ෂයේ සිට 2021 වර්ෂ අවසානය දක්වා රු.2,254,916 ක් වැයකර තිබුණද පරිගණක ජාලය 2022 ජුනි 15 දින වනවිටත් ක්‍රියාකාරී තත්ත්වයේ නොපැවති අතර වැයකර තිබූ මුළු මුදල් කෙරීගෙන යන වැඩ යටතේ දක්වා තිබුණි. | මේ සම්බන්ධයෙන් කමිටුවක් පත්කර ඇත. කමිටු නිර්දේශ ලද පසුව ඒ අනුව කටයුතු කරමි. | පරිගණක පද්ධතිය කඩිනමින් ස්ථාපිත කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2018 වර්ෂයේදී රු.2,750,000 ක් වැයකර ත්‍රීරෝද රථ ලියාපදිංචිය වෙනුවෙන් මිලදීගත් හැඳුනුම්පත් බහාලුම් 50,000 ක් 2021 දෙසැම්බර් 31 දින වන විටත් කිසිදු භාවිතයකින් තොරව අධිකාරියේ ගබඩාව තුළ නිශ්කාර්යව පැවතුණි. | මෙම තොග ශේෂයන් භාවිතා කිරීමට කටයුතු කරනු ලබන බව දන්වමි. | අවශ්‍යතාවය පරිදි වත්කම් මිලදී ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.5.9 ශීර්ෂය 108 - අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශය**

**1.5.9.1 සෞන්දර්ය නිකේතන පාලන අධිකාරිය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අධිකාරියේ පවතින බස්නාහිර පළාත් මාර්ග අමාත්‍යාංශය හා පළාත් පාලන අමාත්‍යාංශය සතු රු.5,350,000 ක් වටිනාකමැති ඩබල් කැබ් රථයේ සහ ත්‍රී රෝද රථයේ අයිතිය අධිකාරියට පවරාගෙන නොතිබූ අතර එම වාහන දෙකෙහි වටිනාකම ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.2,140,000 ක් මෙම වාහන වෙනුවෙන් ක්ෂය වෙන්කිරීම්ද කර තිබුණි. | වාහනවල අයිතිය අධිකාරියට පවරා ගැනීමේ කටයුතු සිදු කරමින් පවතී. | ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කර ඇති වාහන දෙකෙහි අයිතිය අධිකාරියට පවරාගත යුතුය. |

**1.5.10 ශීර්ෂය 109 - ප්‍රධාන ලේකම් කාර්යාලය**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 1.1.7 වගන්තිය සහ 2019 ජුනි 27 දිනැති අංක 05/2019 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03(අ) වගන්තිය ප්‍රකාර නිලධාරියෙකු ස්ථාන මාරුවී පැමිණ මාස 02 ක් ගතවීමෙන් පසු හෝ නිලධාරියෙකු ස්ථාන මාරුවී ගොස් මාස 03 ක් ගතවීමෙන් පසු දෙපාර්තමේන්තු අතර නිරවුල් නොවූ ණය ශේෂ නොපෙන්වීමට වගබලාගත යුතු වුවත් සමාලෝචිත වර්ෂය අවසානයට අමාත්‍යාංශ /දෙපාර්තමේන්තු ඇතුළු ආයතන 27 ක එවැනි නිරවුල් නොකරන ලද | පළාත් පාලන ආයතන වෙත ස්ථාන මාරුවී ගිය නිලධාරීන්ගේ ණය ශේෂයන් මාසික වාරික වශයෙන් පියවන නිසා මෙසේ නිරවුල් නොවූ ණය ශේෂයක් පවතී. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | රු.212,864,069 ක ණය ශේෂ පැවතුණි. | | |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 4.2.2, 4.2.3, 4.5, 4.6 හා 6.3 වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු ඇතුළු ආයතන 19 ක මියගිය හා විශ්‍රාම ගිය නිලධාරීන් හෝ සේවකයින්ගෙන් රු.51,891,920 ක ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මියගිය හා විශ්‍රාම ගිය නිලධාරීන්ගේ ණය ශේෂයන් පාරිතෝෂිතයෙන් අයකර දෙන ලෙසට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත දැනුම්දී ඇති අතර විශ්‍රාම වැටුප් හිමි නැති මිය ගිය නිලධාරීන්ගේ ණය ශේෂයන් අදාළ ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට අදාළ කටයුතු සිදු කරමින් පවතී. | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2019 ජුනි 27 දිනැති අංක 05/2019 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03(ඉ) ඡේදය ප්‍රකාරව අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු ඇතුළු ආයතන 18 ක සේවය හැර ගිය, වැඩ තහනම් කළ නිලධාරීන් නැවත සේවයේ පිහිටුවා ඇතිද යන්න සොයාබලා හෝ වත්කම් පිළිබඳ තහවුරුවක් ලබාගැනීමෙන් අනතුරුව නීතිපති මඟින් රු.16,230,046 ක ණය මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මුදල් අයකර ගැනීමේ කටයුතු සිදු කරමින් පවතී. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඈ) | ආදායම් ගණන්දීමේ නිලධාරීන් තිදෙනෙකු විසින් ඒ ඒ ආයතනවල ආදායම් සංකේත 05 ක් යටතේ අයවිය යුතුව තිබුණු රු.25,470,014 ක් වූ ආදායම් සමාලෝචිත වර්ෂය තුළදී පොත්වලින් ලියාහැර තිබුණි. | විධිමත් අනුමැතිය මත පොත්වලින් ලියාහැර ඇත. | නීති මාර්ගයෙන් හෝ වෙනත් මාර්ගවලින් හෝ හිඟ මුදල් අයකර ගැනීමට නොහැකි බව තහවුරු වන ණය ශේෂ පමණක් කපාහැරිය යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේදී ආදායම් සංකේත 30 ක් යටතේ ආදායම් රැස්කර තිබුණු අතර 2021 දෙසැම්බර් 31දින වනවිටත් එයින් ආදායම් සංකේත 12 කට අදාලව රු.1,451,163,415 ක හිඟ ආදායමක් පැවතුණි. | හිඟ ආදායම් අයකර ගනිමින් පවතී. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තැන්පත් කර වර්ෂ 02 ඉක්ම වූ නමුත් නියාදනය නොකළ දෙපාර්තමේන්තු 04 ක හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 ක (පළාත් සභා ප්‍රතිපාදන) එකතුව රු.57,648,192 ක් | නිරවුල් නොකළ තැන්පතු ගිණුම් ශේෂ 2022 වර්ෂය තුළදී නිරවුල් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන්ට හා ගණන්දීමේ | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වූ තැන්පතු ශේෂ 280 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | නිලධාරීන්ට උපදෙස් ලබාදී ඇත. | |
| (උ) | බස්නාහිර පළාත් සභාව සඳහා මධ්‍යම රජයේ වැය ඇස්තමේන්තුව මඟින් සලසා තිබූ මුළු ශුද්ධ ප්‍රතිපාදනය (පරිපූරක ප්‍රතිපාදනය ඇතුළුව) රු.මිලියන 50,685 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වනවිට රු.මිලියන 48,909 ක් පමණක් උපයෝජනය කර තිබුණි. | අදාළ වර්ෂයේ මුදල් ප්‍රකාශනය සකස් කිරීමේදී පළාත් සභාවේ සියළු වියදම් සඳහා මුදල් යෙදවීමේදී ඊට අදාළ මූල්‍ය මාර්ගය සැකසීමේදී මධ්‍යම රජයෙන් ලබාදෙන එම මුදල් ප්‍රභවයන්ද අපේක්ෂිත ප්‍රදාන ලෙස සලසා ගනී. | මධ්‍යම රජයෙන් ලබාදී තිබූ මුළු ප්‍රතිපාදනයම උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුවේ. |
| (ඌ) | ශීර්ෂ 312 මඟින් ප්‍රාග්ධන වියදම් සඳහා අග්‍රිමය ලෙස රු.1,410,855,000 ක් ලැබී තිබුණද ඒ සඳහා පළාත් සභා අරමුදල් ගිණුමෙන් රු.1,594,770,000 ක වියදමක් දරා තිබීම මත අග්‍රිමය ඉක්මවා රු.183,915,000 ක් වියදම් කර තිබුණි. | 2020 වර්ෂයේදී ඉතිරි වී තිබූ රු.29,350,000 ක මුදල 2021 වර්ෂයේ උක්ත වැය විෂයයේ වියදම් දැරීමට භාවිතා විය. | අදාළ වර්ෂයට ලැබෙන මුදලින් එම වර්ෂයේම වියදම් දැරිය යුතුය. |
| (එ) | ප්‍රාග්ධන වැය විෂයයන් 02 ක් සඳහා වර්ෂය තුළ ලැබී තිබූ රු.173,350,000 ක් වියදම් කර නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට බස්නාහිර පළාත් සභා අරමුදලට අයත් බැංකු ජංගම ගිණුම්වල අක්‍රීය මුදල් ශේෂයක් පැවතුණු අතර මධ්‍යම රජය අපේක්ෂා කළ ප්‍රාග්ධන වැඩසටහන් නියමිත පරිදි ක්‍රියාත්මක වී නොතිබුණි. | බස්නාහිර පළාත් සභාවට ද්‍රවශීල මුදල් ලෙස ලැබී ඉතිරිව තිබුණේ රු.6,400,000 ක් පමණක් බව පිළිගනිමි. | ප්‍රාග්ධන වැය විෂයයන් යටතේ ලැබෙන මුදල් සියල්ලම අදාළ කාර්යයන් වෙනුවෙන් වැයකළ යුතුය. |
| (ඒ) | 2014 වර්ෂයේදී මහර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සේප්පුවේ තිබී අතුරුදහන් වූ රු.10,082,245 ක මුදලින් පළාත් සභා අරමුදලට අයත් රු.915,786 ක මුදලට අදාළ දෙපාර්තමේන්තු පරීක්ෂණය අවසන්වී තිබුණද සමාලෝචිත වර්ෂය අවසානයටත් එම මුදල වගකිවයුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අස්ථාන ගත වූ රු.1,082,245 ක මුදල සම්බන්ධයෙන් මු.රෙ. 104(1) සමාලෝචන වාර්තාවේ නිර්දේශ අනුව අවශ්‍ය ක්‍රියා මාර්ග ගන්නා ලෙස දන්වා ඇති බව. | පළාත් සභා අරමුදලට අදාළ මුදල අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.5.11 ශීර්ෂය 110 - ඉංජිනේරු කාර්යාංශය**

| විගණන නිරීක්ෂණය | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 දෙසැම්බර් 28 දිනැති අංක 14/2021 දරන මූල්‍ය චක්‍රලේඛයේ 2.5.14.1 වගන්තිය ප්‍රකාර සෑම ගණන්දීමේ නිලධාරියෙකුම මූල්‍ය තත්ත්ව ප්‍රකාශය සඳහා ඇතුළත් කරනු ලබන සෑම වත්කමක් සඳහා සවිස්තරාත්මක භාණ්ඩ පිළිබඳ ලැයිස්තු නඩත්තු කළ යුතු වුවත්, පළාත් ඉංජිනේරු කාර්යාංශය විසින් රු.13,359,026,634 ක වත්කම්වලට අදාළ ලැයිස්තු නඩත්තු කර නොතිබුණි. | ඉදිරියේදී පළාත් භාණ්ඩාගාරයේ උපදෙස් පරිදි කටයුතු කරන බව කාරුණිකව දන්වමි. | වත්කම් සඳහා කේවල ලැයිස්තු නඩත්තු කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | බස්නාහිර පළාත් ඉංජිනේරු කාර්යාංශය විසින් ලේඛන කළමනාකරණ පද්ධතියක් සැකසීම සහ ක්‍රියාවලීන් ස්වයංක්‍රීයකරණ පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා 2018 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා රු.13,917,715 ක් බස්නාහිර පළාත් තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන ආයතනය වෙත ගෙවා තිබුණද 2019 වර්ෂයේ අවසන් කිරීමට නියමිතව තිබූ මෙම ලේඛන කළමනාකරණ පද්ධතිය ස්ථාපිත කිරීම 2022 ජුනි 30 දිනටද අවසන් කර නොතිබුණි. | ලිපිගොනු කළමනාකරණ පද්ධතියේ කොටසකට අදාළව කොන්ත්‍රාත්තුවේ පරිදි ලිපිගොනු ස්කෑන් කිරීමේ කටයුතුවලින් සියයට 90 කට ආසන්න ප්‍රමාණයක් සමාලෝචිත වර්ෂය අවසානයට පද්ධතියට ඇතුළත් කර ඇති බව දන්වමි. | ලේඛන කළමනාකරණ පද්ධතිය කඩිනමින් ස්ථාපිත කර අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.5.12 ශීර්ෂය 111 - ආදායම් දෙපාර්තමේන්තුව**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| බස්නාහිර පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ මහරගම නියෝජ්‍ය ආදායම් කොමසාරිස් කාර්යාලය පිහිටි ගොඩනැගිල්ලෙහි සවිකර තිබූ වායු සමීකරණ යන්ත්‍ර 13 ක් 2020 අගෝස්තු 20 දින නව ගොඩනැගිල්ල වෙත ගෙන ගොස් තිබුණද සමාලෝචිත වර්ෂය අවසානයටත් ඒවා ප්‍රයෝජනයට නොගෙන පැවති අතර ඒවා අවශ්‍ය නොවේ නම් අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | වායු සමීකරණ යන්ත්‍ර සම්බන්ධයෙන් තාක්ෂණික වාර්තාවක් ලබාගෙන ඉදිරි කටයුතු සිදු කිරීම සඳහා කටයුතු කරමින් පවතී. | වත්කම් උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |

**1.5.13 ශීර්ෂය 112 - පළාත් පාලන දෙපාර්තමේන්තුව**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පළාත් පාලන දෙපාර්තමේන්තුවේ විමර්ශන කටයුතුවලට අදාළව සහකාර කොමසාරිස්වරයෙකු ඇතුළු විමර්ශන නිලධාරීන් 53 දෙනෙකු අනුයුක්ත කර තිබුණද 2018 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා දෙපාර්තමේන්තුවේ විමර්ශන අංශය වෙත ලැබී තිබුණු 2,824 ක්වූ මුළු මහජන පැමිණිලි සංඛ්‍යාවෙන් පැමිණිලි 1,222 ක් එනම් සියයට 43 ක් 2022 අප්‍රේල් මාසය වන විටත් විසඳා නොතිබුණි. | තනතුරුවල පුරප්පාඩු පවතින බව. | මහජන පැමිණිලි කඩිනමින් විසඳීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | බස්නාහිර පළාත්, පළාත් පාලන කොමසාරිස් ව්‍යාපෘති බලධාරියා වූ හොරණ මාවක්ඹය පහසුකම් මධ්‍යස්ථානය හා හෙළ බොජුන් හළ ඉදිකිරීමේ ව්‍යාපෘතියේ අදියර - 3 සඳහා රු.3,000,000 ක් වැයකර 2020 වර්ෂයේදී ව්‍යාපෘතියේ වැඩ නිමකර තිබුණද වසර 02 කට ආසන්න කාලයක් තුළ හෙළ බොජුන්හලේ ව්‍යාපාරික කටයුතු ආරම්භ නොකිරීම හේතුවෙන් ව්‍යාපෘතියේ අරමුණු ඉටු වී නොතිබුණි. | සනීපාරක්ෂක පහසුකම් සඳහා ඉදිකිරීමේ කටයුතු ආරම්භ කිරීමට කටයුතු කර ඇති බව දන්වමි. | ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු කඩිනමින් ඉටු කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | බස්නාහිර පළාත් සභා බල ප්‍රදේශයේ පිහිටි පළාත් පාලන බල මණ්ඩල 49 ක 2022 ජුනි 30 දිනට හිඟ ආදායම රු.7,331,742,054 ක් විය. | අයකර ගනිමින් පවතී. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | මීගමුව මහා නගර සභාවේ නිලධාරීන්ට එරෙහිව විගණකාධිපතිවරයා විසින් පනවන ලද අධිභාර 02 කට අදාලව අයකර ගතයුතු රු.2,325,780 ක වටිනාකමක් 2021 දෙසැම්බර් 31 දිනටද අයකර ගෙන නොතිබුණි. | අදාළ කටයුතු සිදු කරමින් පවතී. | අධිභාර සම්බන්ධයෙන් කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඉ) | අගලවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටි කැකුලන්දල දිවා සුරැකුම් මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා | අවශ්‍ය උපකරණ හා අනෙකුත් පහසුකම් සම්පූර්ණ කර ක්‍රියාත්මක තත්ත්වයට | ගොඩනැගිල්ල අපේක්ෂිත කාර්යය සඳහා භාවිතයට ගත |

| | | | |
|---|---|---|---|
| | බස්නාහිර පළාත් සංවර්ධන ප්‍රදාන යටතේ වියදම් කළ මුළු මුදල රු.6,889,483 ක්වූ අතර මෙම ගොඩනැගිල්ල 2020 නොවැම්බර් මාසයේ වැඩ නිම කර තිබුණද වසර 02 කට ආසන්න කාලයක් ගතවී ඇතත් ගොඩනැගිල්ල අපේක්ෂිත කාර්යය සඳහා භාවිතයට ගෙන නොතිබුණි. | පත් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇත. | යුතුය. |

**1.5.14 ශීර්ෂය 113 - සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව**

-----------------------------------------------

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ----------------------- | --------------------- | ------------ |
| (අ) | 2009 නොවැම්බර් 13 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 438 ප්‍රකාර රාජ්‍ය ආයතනවල අපහරණය කළයුතු භාණ්ඩ අපහරණය කිරීමට කටයුතු කළයුතු වුවත් මීරිගම මූලික රෝහලේ 2020 වර්ෂයේදී හඳුනාගන්නා ලද ප්‍රයෝජනයට ගත නොහැකි භාණ්ඩ වර්ග 55 කට අදාළ අයිතම 221 ක් 2022 අගෝස්තු 31 දිනටත් අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | 2022 වර්ෂයේදී අවසන් කිරීමට කටයුතු කරන බව දන්වමි. | චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | පළාත් මූල්‍ය රීති 41.1. (ආ) හා 91.1.6 විධිවිධාන ප්‍රකාරව ගාස්තු ප්‍රමාණ වෙනස්කිරීම මඟින් ආදායම් වැඩිකිරීම සඳහා වූ හැකියාව සොයාබැලීම සහ සැපයුම් හා සේවා සඳහා අයකිරීම් ගාස්තු යනාදිය පවත්නා ආර්ථික හා වෙනත් තත්ත්වයන් පිළිබඳව සලකා බලා කලින් කල සමාලෝචනය කර ප්‍රතිශෝධනය කළ යුතුව තිබුණද වෛද්‍ය සහතික නිකුත් කිරීමේ ගාස්තු ආදායම 2009 ජුනි 11 සංශෝධනය කිරීමෙන් පසු වර්ෂ 12 ක කාලයක් ගතවී තිබුණද ප්‍රතිශෝධනය කිරීමට සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව පියවර ගෙන නොතිබුණි. | විගණනය විසින් පෙන්වාදී ඇති නිරීක්ෂණය හා එකඟ වන බව දන්වමි. | පළාත් මූල්‍ය රීති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | බස්නාහිර පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ රු.115,988,935 | නොපියවූ අග්‍රිම ශේෂය හැකි ඉක්මනින් පියවා අවසන් | නොපියවූ අග්‍රිම ශේෂය නොපමාව |

| | | | |
|---|---|---|---|
| | ක අග්‍රිම ශේෂය 2022 අගෝස්තු 31 දින වනවිටත් බස්නාහිර පළාත් භාණ්ඩාගාරයට නිරවුල් කර නොතිබුණි. | කරන ලෙස සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව වෙත උපදෙස් ලබාදී ඇත. | පියවීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | බස්නාහිර පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ රු.21,801,469 ක ප්‍රේෂණ ශේෂය 2022 අගෝස්තු 31 දින වනවිටත් බස්නාහිර පළාත් භාණ්ඩාගාරයට පියවා නොතිබුණි. | ප්‍රේෂණ ශේෂය හැකි ඉක්මනින් පියවා අවසන් කරන ලෙස සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව වෙත උපදෙස් ලබාදී ඇත. | ප්‍රේෂණ ශේෂය නොපමාව පියවීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | කළුතර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයට අයත් රෝහල් සඳහා අනුයුක්තව සිට විදේශ නිවාඩු ලබාගත් වෛද්‍යවරුන් දෙදෙනෙකුගේ විදේශ නිවාඩු අවසන් වී තිබුණද සේවයට වාර්තා කර නොතිබුණු අතර ආයතන සංග්‍රහයේ XII පරිච්ඡේදයේ 16.5 වගන්තිය හා අත්සන් තබා ඇති ගිවිසුම ප්‍රකාරව අයවිය යුතු එකතුව රු.2,648,387 ක මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අත්සන් කර ඇති ගිවිසුම කාර්යාලයට ලැබී ඇති බවද ඒ අනුව කටයුතු සිදු කරන බවද දන්වමි. | ගිවිසුම් ප්‍රකාරව අයවිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | හොරණ මූලික රෝහලේ 2021 වර්ෂයේ සනීපාරක්ෂක සේවය පවත්වාගෙන යාම සම්බන්ධයෙන් සිදුකරන ලද නියැදි පරීක්ෂාවේදී මාසිකව රු.3,534,764 ක මුදලට කොන්ත්‍රාත්තුව ලබා ගත් කොන්ත්‍රාත්කරු විසින් ගිවිසුම් ප්‍රකාරව සේවයේ යොදවන පුද්ගලයන් පිළිබඳ තොරතුරු රෝහල වෙත විධිමත්ව ලබා නොදීම, එකම සේවක පිරිසක් අඛණ්ඩව සේවයේ නොයෙදීම, බොහෝ දිනවල පවිත්‍රතා කටයුතු නිසි පරිදි සිදු නොවීම, සේවකයින් 38 – 40 ත් අතර සංඛ්‍යාවක් සනීපාරක්ෂක සේවයේ යොදවන බව පැමිණීමේ ලේඛන අනුව වාර්තාකර තිබුණද නියැදි විගණන පරීක්ෂණ දිනයේදී සේවකයන් 33 ක් පමණක් සේවයේ යෙදී තිබීම මත රෝහල් බලධාරීන් විසින් සනීපාරක්ෂක කටයුතු පිළිබඳව විධිමත් අධීක්ෂණයකට ලක් කර නොතිබූ බව තහවුරු විය. | නිත්‍ය කාර්යය මණ්ඩලයේ අය අසනීප වූ විට ඒ වෙනුවට තාවකාලික සේවකයන් සේවයට යොදවා ඇත. සේවකයින් වෙනස්වීමේදී හොරණ රෝහලේ වෛද්‍ය අධිකාරී වෙත දැනුම්දීමට කටයුතු කරන ලෙස උපදෙස් දී ඇත. | සනීපාරක්ෂක කටයුතු රෝහලේ නිලධාරියෙකුගේ අධීක්ෂණයට ලක්විය යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (උ) | (i) | හොරණ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයේ ජලභීතිකා එන්නත්කරණය පූර්ව වැඩසටහනක් සකසා ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකගේ අනුමැතියක් ලබා ගෙන ආරම්භ කර නොතිබූ අතර 2021 වර්ෂයේ එන්නත්කරණය සඳහා ලැබුණු එන්නත් මාත්‍රා 4,000 ක් භාවිතය සම්බන්ධයෙන් විධිමත් ලේඛණයක් නඩත්තු කර නොතිබුණි. | දැනට පරිපාලන මහජන සෞඛ්‍ය පරීක්ෂක විසින් භාරගෙන අගුළු දමා ඇති ශීතකරණයක ගබඩාකර තම අධීක්ෂණය යටතේ එන්නත්කරුවන්ට අවශ්‍ය එන්නත් නිකුත් කිරීම සහ ආපසු ලබා ගැනීම සිදු කරයි. එන්නත් චලන ලේඛනයක් නඩත්තු කිරීමට කටයුතු කර ඇත. | එන්නත්කරණ වැඩසටහන්වලට අදාළ එන්නත් මාත්‍රා තොරතුරු විධිමත් ලෙස ලේඛනගත කළ යුතුය. |
| | (ii) | 2020 ජනවාරි සිට 2021 මාර්තු දක්වා හොරණ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයේ එන්නත්කරුවන්ගේ වාර්තා අනුව එන්නත්කරණ 6,765 ක් සිදු කර ඇති බව වාර්තා කර තිබූ අතර, දිස්ත්‍රික් ජලභීතිකා අංශයේ වාර්තා අනුව එය 12,193 ක් ලෙස ද ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය විසින් නාරාහේන්පිට මහජන සෞඛ්‍ය පශු වෛද්‍ය සේවා අංශය වෙත යවා ඇති වාර්තා අනුව එම සංඛ්‍යාව 9,074 ක් ලෙසද එකිනෙකට පරස්පර සංඛ්‍යා දත්ත පැවතුණි. | කොවිඩ් 19 වසංගත මර්ධන රාජකාරි හා නිරෝධායන රාජකාරිවලට ප්‍රමුඛතාවය ලබාදීම හේතුවෙන් ලේඛනගත කිරීම් ප්‍රමාද විය. | එන්නත්කරණ වාර්තා දෛනිකව යාවත්කාලීන කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඌ) | | ඖෂධ වර්ගවල තත්ත්ව අසමත් (Quality fail) වී ඇති බැවින් රෝගීන්ට ලබා දීමට නුසුදුසු බව තහවුරු වීමෙන් එම ඖෂධ රෝගීන්ට බෙදා හැරීම නතර කරන ලෙස මධ්‍යම රජයේ වෛද්‍ය සැපයුම් අංශය මගින් 2021 වර්ෂයේ දී චක්‍රලේඛ 96 ක් මගින් ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙත දැනුම් දී තිබුණි. එම දැනුම් දීම් සිදුවන විටත් රු.2,395,212 ක් වටිනා තත්ත්ව අසමත් වූ ඖෂධ වර්ග 27 ක, ඒකක 473,341 ක ඖෂධ කළුතර දිස්ත්‍රික්කයේ රෝහල් සහ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල වෙත බෙදා හැර තිබුණි. චක්‍රලේඛ නිකුත් | ප්‍රාදේශීය වෛද්‍ය සැපයීම් අංශය වෙත ලැබෙන ඖෂධ ලැබුණු වහාම රෝහල් හා අනෙකුත් සෞඛ්‍ය ආයතන වෙත බෙදා හරින හෙයින් තත්ත්ව අසමත් ඖෂධ චක්‍රලේඛ මඟින් දැනුම් දෙනවිට බොහෝ ප්‍රමාණයක් නිකුත් කර අවසන්ය. | තත්ත්වයෙන් අසමත් ඖෂධ රෝගීන්ට ලබාදීම නැවැත්වීම සඳහා විධිමත් වැඩ පිළිවෙලක් හඳුන්වා දිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කිරීමෙන් පසුව රු.1,451,106 ක් වටිනා ඒකක 282,088 ක ඖෂධ රෝහල් වෙතින් ඉවත් කරගෙන තිබුණද, ඒ වනවිටත් රු.944,106 ක් වටිනා තත්ත්ව අසමත් වූ ඒකක 189,155 ක ඖෂධ රෝගීන් වෙත නිකුත් කර තිබුණි. | | |
| (එ) | පරිත්‍යාගයක් ලෙස ලැබී තිබූ මීරිගම රෝහල් භූමිය මූලික සැලසුම්වලට අනුව හෙක්ටයාර 6.4 ක විශාලත්වයකින් යුක්ත වුවද එම ඉඩමේ අයිතිය සමාලෝචිත වර්ෂය අවසානයටත් විධිමත්ව පවරාගෙන නොතිබුණි. | රෝහල් භූමි පරිශ්‍රය පවරා ගැනීම වෙනුවෙන් මිනින්දෝරු දෙපාර්තමේන්තුව වෙත මැනුම් ගාස්තු ගෙවා ඇත. | රෝහල් භූමියේ අයිතිය පවරා ගැනීමට කඩිනමින් කටයුතු කළ යුතුය. |
| (ඒ) | 2020 වර්ෂයේ දී රු.3,300,000 ක් වටිනා Auto mated Blood Culture System යන්ත්‍රයක් හොරණ මූලික රෝහලට ලබා දී එහි කටයුතු සඳහා නිලධාරීන් තිදෙනෙකු පුහුණු කර තිබුණ ද, යන්ත්‍රය උපයෝජනය කළ හැකි විශේෂඥ වෛද්‍යවරයෙකු රෝහලට අනුයුක්ත කිරීමට බලධාරීන් කටයුතු නොකිරීමෙන් එම යන්ත්‍රය 2022 ජූලි වනවිටත් අපේක්ෂිත කාර්යය සඳහා භාවිතයට ගැනීමෙන් තොරව නිශ්ක්‍රීයව පැවතුණි. | එම තනතුරට වෛද්‍ය නිලධාරිවරයෙක් අනුයුක්ත කිරීමක් සිදුවී නොමැති බව දන්වමි. | යන්ත්‍රය පූර්ණ උපයෝජනයෙන් යුතුව භාවිතයට ගත හැකි පරිදි කඩිනම් වැඩ පිළිවෙලක් යෙදිය යුතුය. |
| (ඔ) | වතුපිටිවල රෝහලේ රු.1,955,745ක් වටිනා ඖෂධ වර්ග 46 ක්ද මීරිගම රෝහලේ රු.69,945 ක් වටිනා ඖෂධ 06 ක්ද, හොරණ මූලික රෝහලේ රු.130,021 ක් වටිනා ඖෂධ 14 ක්ද වශයෙන් රෝහල් 03 ක එකතුව රු.2,155,711 ක්වූ ඖෂධ වර්ග 66 ක් සමාලෝචිත වර්ෂයේදී කල් ඉකුත්වී තිබුණි. කල් ඉකුත්වීමට පෙර මෙම ඖෂධ ප්‍රයෝජනයට ගැනීම හෝ ප්‍රයෝජනයට ගතහැකි රෝහල් වෙත මාරු කිරීමේ ක්‍රමවේදයක් සැකසීමට කටයුතු කර නොතිබුණි. | කොවිඩ් 19 වසංගත තත්ත්වය මත ප්‍රතිකාර සඳහා රෝහල් වෙත පැමිණි රෝගීන් සංඛ්‍යාව අඩුවිය. තවද මෙම තත්ත්වය දිවයින පුරා සියළුම රෝහල්වල පැවතීම හේතුවෙන් බොහෝමයක් ඖෂධ වෙනත් රෝහල්වලට මාරු කිරීමට අපහසු විය. | කල් ඉකුත්වීමට පෙර මෙම ඖෂධ ප්‍රයෝජනයට ගත හැකි රෝහල් වෙත මාරු කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.5.15 ශීර්ෂය 118 - ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2012 අංක 04 දරන ඉඩම් සංවර්ධන ප්‍රඥප්තියේ 4(2) උප වගන්තිය ප්‍රකාරව ප්‍රඥප්තියේ යොමුගත උප වගන්තිය ප්‍රකාරව රජයේ ඉඩමක් ආණ්ඩුව විසින් ප්‍රයෝජනයට ගනු ලැබීම සම්බන්ධයෙන් පළාත් සභාවේ එකඟත්වය ලබාදීමේදී අනුගමනය කලයුතු ක්‍රියාපටිපාටි සකස් කර නොතිබුණි. | මේ වන විට පළාත් සභාවේ නිල කාලය අවසන්වී ඇති බැවින් හා විෂය භාර අමාත්‍ය වරයෙක් නොමැති බැවින් ප්‍රායෝගිකව මෙම කටයුත්ත කිරීමට හැකියාවක් නොමැත. | ප්‍රඥප්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 1.5.16 ශීර්ෂය 120 - සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුව සතු වාහන 42 ක හා ගොඩනැගිලි 30 ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | තක්සේරු කිරීමේ කටයුතු සිදු කරමින් පවතී. | වත්කම් තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.5.17 ශීර්ෂය 123 - ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ව්‍යාපාර ලියාපදිංචි සහතික නිකුත් කිරීම සඳහා මෘදුකාංගයක් 2020 ජූනි 16 දින මිලදී ගෙන තිබුණි. නමුත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට මෘදුකාංගයට තොරතුරු ඇතුළත් කිරීමට ප්‍රවේශ වීමේ පහසුකම ලබා දී නොතිබූ අතර බස්නාහිර පළාත තුළ දැනට ලියාපදිංචි වී ඇති ව්‍යාපාර ආයතන පිළිබඳ තොරතුරු ඇතුලත්වී නොතිබුණි. ඒ හේතුවෙන් ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් රු.8,631,583 ක් වැයකර මිලදීගෙන තිබූ පරිගණක මෘදුකාංගයෙන් අපේක්ෂිත අරමුණු ඉටුකරගත නොහැකි වී තිබුණි. | 2022 වර්ෂයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල අදියර වශයෙන් මෙම මෘදුකාංගය ස්ථාපිත කිරීමට නියමිතව පවතී. | පරිගණක මෘදුකාංගය කඩිනමින් ස්ථාපිත කිරීමට කටයුතු කළ යුතුය. |

**1.5.18 ශීර්ෂය 126 - අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | චක්‍රලේඛ උපදෙස්වලට පටහැනි ලෙස හොරණ, කළුතර හා මතුගම කලාප අධ්‍යාපන කාර්යාල විසින් පිළිවෙලින් රු.1,657,900 ක්, රු.1,378,994 ක් හා රු.838,102 ක් වශයෙන් එකතුව රු.3,874,996 ක නිල ඇඳුම් වැඩිපුර මිලදීගෙන තිබුණි. පාසැල් හා කොට්ඨාශ අධ්‍යාපන කාර්යාල මඟින් නිවැරදි දත්ත හා තොරතුරු ලබා ගැනීමේ හැකියාව තිබියදීත් ඒ අනුව කටයුතු නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ රු.3,874,996 ක අමතර වියදමක් දරා තිබුණි. එසේම ඉහත කලාප අධ්‍යාපන කාර්යාලවල කිසිදු පාසලක අ.පො.ස.(සා.පෙළ) හෝ අ.පො.ස.(උ.පෙළ) දෙවන වරට පෙනී සිටි සිසුන් වෙනුවෙන් පන්ති කාමර වෙන් කිරීම හා කාලසටහන් අනුමත කිරීම සිදුකර නොතිබුණද එම සිසුන්ට ද නිල ඇඳුම් ඉල්ලුම් කර තිබීම නිල ඇඳුම් වැඩිපුර මිලදී ගැනීමට හේතුවක් වී තිබුණි. | කොවිඩ් වසංගතය හේතුවෙන් වරින්වර පාසල් වසා තැබීම හේතුවෙන් නිල ඇඳුම් බෙදාදෙන අවස්ථාවේදී සිසුන් පාසල හැර ගොස් තිබීමත්, කමිස රෙදි එක් වරකදීත් කලිසම් රෙදි එක් වරකදීත් ලැබීම හේතුවෙන් කලිසම් රෙදි ලබාගත් සිසුන් කමිස රෙදි භාරදෙන විට විදුහලෙන් බැහැර වී තිබීම. | චක්‍රලේඛ විධිවිධාන පරිදි කටයුතු කළ යුතුය. |
| (ආ) | විශේෂ නිල ඇඳුම් භාවිතා කරන හොරණ අධ්‍යාපන කලාපයේ රජයේ අනුමත පාසලක් විසින් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව විශේෂ නිල ඇඳුම් ඉල්ලා තිබුණ ද ඒ පිළිබඳ අවධානය යොමු කිරීමෙන් තොරව රු.1,695,287 ක් වටිනා සාමාන්‍ය පාසැල්වලට ලබා දෙන නිල ඇඳුම් කට්ටල 2021 හා 2022 වර්ෂවලදී ලබා දීමට බලධාරීන් කටයුතු කර තිබුණි. | මින් ඉදිරියේදී පාසැල් නිල ඇඳුම් සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී අදාළ චක්‍රලේඛ ප්‍රකාරවම කටයුතු කළ යුතු බවත් නිසි අධීක්ෂණයකින් යුතුව මේ සම්බන්ධයෙන් කටයුතු කළ යුතු බවත් සියළු කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් 2022 මැයි 17 ලිපියෙන් දැනුවත් කර ඇත. | චක්‍රලේඛ විධිවිධාන පරිදි කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2021 වර්ෂයට නොමිලේ ලබාදෙන පාසල් පෙළ පොත් හා ගුරු මාර්ගෝපදේශ සංග්‍රහ බෙදාහැරීම සම්බන්ධයෙන් අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල් විසින් 2020 පෙබරවාරි 20 දිනැතිව නිකුත් කර තිබුණු ලිපිය ප්‍රකාරව නිවැරදිව පෙළපොත් ඇණවුම් කිරීමට උපදෙස් ලබාදී තිබියදීත් ඒ පිළිබඳ අවධානය | මින් ඉදිරියේදී පාසැල් පෙළපොත් බෙදාදීම සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී චක්‍රලේඛ ප්‍රකාරවම කටයුතු කළ යුතු බවටත් නිසි අධීක්ෂණයකින් යුතුව ක්‍රියා කළ යුතු බවටත් දන්වමින් බස්නාහිර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂකගේ 2022 මැයි 17 | චක්‍රලේඛ විධිවිධාන පරිදි කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | යොමු කිරීමෙන් තොරව හොරණ හා මතුගම කලාප අධ්‍යාපන කාර්යාල විසින් පිළිවෙලින් රු.5,094,065 ක් හා රු.2,264,867 ක් වශයෙන් එකතුව රු.7,358,932 ක් වටිනා පෙළ පොත් වැඩිපුර ඇණවුම් කර ගෙන්වා ගෙන තිබුණි. | ලිපියෙන් සියළු කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් දැනුවත් කර ඇත. | |
| (ඇ) | පාසල්වල භෞතික සම්පත් පිළිබඳ 2009 වර්ෂයේ සිදුකරන ලද සමීක්ෂණය අනුව මහරගම විද්‍යාකර බාලිකා විද්‍යාලයට අනුබද්ධිත නීලම්මහර විද්‍යාලයට අක්කර 02, රූඩ් 02ක වපසරියකින් යුත් ක්‍රිඩාපිටියක් පැවතියද භෞතික පරීක්ෂාවේදී එකී ක්‍රිඩාපිටිය පෞද්ගලික ක්‍රීඩා සමාජයකට පරිහරණය සඳහා අවකාශය සලසා තිබූ බව තහවුරු විය. | මැනුම් කටයුතු සිදු කිරීමට කොළඹ දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මැනුම් අධිකාරී වෙත ලිපියක් යොමුකර ඇති අතර ක්‍රීඩාංගනය පවතින ඉඩම සම්බන්ධයෙන් කටයුතු සිදු කරමින් පවතී. | ක්‍රිඩාපිටියේ අයිතිය පාසල වෙත පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | 2016 වර්ෂයේදී බප/කො/ ක්ලිෆ්ටන් බාලිකා මහා විදුහලේ භූමියට යාබද භූමියේ පෞද්ගලික නිවාස සංකීර්ණයක් ඉදිකිරීම නිසා මෙම පාසලේ තෙමහල් ගොඩනැගිල්ලක් ගිලා බැසීම හා දෙදරීමට ලක්වී ඉරිතලා පැලුම් මතුවී අලාභ හානි සිදුවී තිබුණද ඒ සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අදාළ ආයතනය එකඟ වූ පහසුකම් සැලසීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස 2022 අගෝස්තු 10 ලිපියෙන් දැනුවත් කර ඇත. | අලාභ හානි සිදුවූ ගොඩනැගිලි සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඊ) | කොළඹ දිස්ත්‍රික්කයේ කොළඹ, ජයවර්ධනපුර, හෝමාගම හා පිළියන්දල කලාප අධ්‍යාපන කාර්යාල 04 හි හා ගම්පහ කලාප අධ්‍යාපන කලාපයේ සිසුන් සංඛ්‍යාව අඩුවීම හේතුවෙන් පාසල් 64 ක්ද, කළුතර දිස්ත්‍රික්කයේ හොරණ,මතුගම හා කළුතර කලාප අධ්‍යාපන කාර්යාලයට අයත් පාසල් 41 ක්ද සමාලෝචිත වර්ෂය අවසාන වනවිට වසාදමා තිබුණි. තවද කොළඹ දිස්ත්‍රික්කයේ කලාප අධ්‍යාපන කාර්යාල 04 හි හා ගම්පහ කලාප අධ්‍යාපන කාර්යාලයේ වර්තමාන ශිෂ්‍ය සංඛ්‍යාව 100 ට අඩු පාසල් 55 ක් පැවති අතර මතුගම හා කළුතර කලාපය තුළ සිසුන් 100 ට අඩු පාසැල් 54 ක් පැවතුණි. | අදහස් දක්වා නොමැත. | ශිෂ්‍ය සංඛ්‍යාව අඩු පාසල්වල ශිෂ්‍ය සංඛ්‍යාව වැඩි කිරීමට කටයුතු කළ යුතුය. |
| (උ) | ගම්පහ කලාප අධ්‍යාපන කාර්යාලයට අයත් පාසල් 122 ක් පිහිටි ඉඩම් විධිමත් පරිදි පවරාගෙන නොතිබුණි. | පාසල් ඉඩම් පවරා ගැනීමේ කටයුතු සිදු කරමින් පවතී. | ඉඩම් විධිමත් පරිදි පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඍ) | පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සතු කොළඹ දිස්ත්‍රික්කයේ නිල නිවාස 115 ක් කළුතර හා මතුගම කලාපවල නිල නිවාස 13 ක් පැවති අතර එයින් 2021 දෙසැම්බර් 31 වනවිට නිල නිවාස 66 ක පමණක් පදිංචිව සිටි අතර නිල නිවාස 62 ක් ඌන උපයෝජිතව පැවතුණි. | නිල නිවාස ඉල්ලුම් කර නොතිබූ අවස්ථා පැවතුණි. සමහර නිල නිවාස අළුත්වැඩියා කළ යුතුව පැවතුණි. | අළුත්වැඩියා කළ යුතුව පවතින නිල නිවාස පවතී නම් එම නිල නිවාස අළුත්වැඩියා කර සියළු නිල නිවාස භාවිතයට ගත යුතුය. |
| (එ) | හොරණ කළාප අධ්‍යාපන කාර්යාලයේ වෙන්කළ වාහනයක් හිමි නිලධාරියෙකුට සංචිත වාහනයක්ද ලබා දී තිබුණි. සංචිත වාහනයේ ධාවන සටහන් පරික්ෂාවේ දී එම වාහනයද අදාළ නිලධාරියා විසින් වෙන්කළ වාහනයක් ලෙස භාවිතා කර තිබූ බව නිරීක්ෂණය විය. ඒ අනුව, 2019 මැයි 31 දිනැති අංක 13/2008(iv) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය පරිදි වෙන්කළ වාහන සඳහා මසකට ඉන්ධන ලීටර 140 ක් හිමි විය යුතු වුවද මෙම නිලධාරියා විසින් එම ප්‍රමාණය ඉක්මවා 2020 වර්ෂයේ දී ඉන්ධන ලීටර 1,272 ක් ද 2021 වර්ෂයේ දී ඉන්ධන ලීටර 1,400 ක් ද වශයෙන් රු.286,032 ක් වටිනා එකතුව ඉන්ධන ලීටර 2,672 ක් වැඩිපුර භාවිතා කර තිබුණි. | නිලධාරියාගේ වාහන භාවිතය සම්බන්ධයෙන් කමිටුවක් පත්කර පරීක්ෂණයක් කෙරෙමින් පවතින බව දන්වමි. | මේ සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වා අලාභය අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

---------------------

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

-------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පළාත් සභා අරමුදලේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.11,649,854,163 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.1,170,517,374 ක් විය. ඒ අනුව අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.10,479,336,789 ක වර්ධනයක් ඇති වී තිබුණු අතර එම වර්ධනය සඳහා බදු ආදායම පූර්ව වර්ෂයට සාපේක්ෂව රු.8,778,392,763 කින් වැඩිවීම හා රජයේ පුනරාවර්ථන ප්‍රදාන ලැබීම් රු.1,511,000,000 කින් වැඩිවීම හේතුවී තිබුණි.

**3 කාර්ය මණ්ඩල පරිපාලනය**

-------------------------

**3.1 පළාත් සභා අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා වෙනත්**

---------------------------------------------------

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කාර්ය පටිපාටි හා රීති සංග්‍රහයේ XXIII පරිච්ඡේදයේ 192(I)(III)(V) වගන්තිය | ස්ථාන මාරු කිරීමේදී 2000 අංක 07 දරන පළාත් සභා ලේකම් කාර්යාල කාර්යය | බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කාර්යය පටිපාටි හා |

| | | | |
|---|---|---|---|
| | ප්‍රකාරව වාර්ෂික ස්ථානමාරු ප්‍රතිපත්ති හා පරිපාටි සකස් කර ස්ථානමාරු ක්‍රියාත්මක කළ යුතු වුවත් බස්නාහිර පළාතේ, සභා ලේකම් කාර්යාලයේ නිලධාරීන් 17 දෙනෙකු වසර 05 ත් 30 ත් අතර කාලයක් ස්ථානමාරු වීමකින් තොරව එකම සේවා ස්ථානයේ සේවය කරමින් පැවතුණි. | මණ්ඩල ප්‍රඥප්තියට අනුව කටයුතු කරන ලදී. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | බස්නාහිර පළාත් සංචාරක මණ්ඩලය සඳහා 2019 සැප්තැම්බර් 30 දිනැති කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක DMS/WP/0507 දරන ලිපිය මඟින් කාර්ය මණ්ඩලය අනුමත කර තිබූ නමුත් එම කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට සමාලෝචිත වර්ෂය අවසානයටත් කටයුතු කර නොතිබුණු අතර වැඩ බලන, කොන්ත්‍රාත් පදනම හා තාවකාලික පදනම යටතේ සියළු නිළධාරීන් අනුයුක්ත කර තිබුණි. | මෙම බඳවා ගැනීම ප්‍රමාද වීමට රටේ පැවති කොවිඩ් වසංගත තත්ත්වය බලපෑ බව දන්වමි. | මණ්ඩලයේ කටයුතු පවත්වාගෙන යාමට ස්ථිර කාර්යය මණ්ඩලයක් පැවතිය යුතුය. |
| (ඇ) | බස්නාහිර පළාතේ මාර්ග සංවර්ධන අධිකාරියේ විවිධ ව්‍යාපෘති හා කාර්යයන් සඳහා අනුමත කාර්ය මණ්ඩලයට අමතරව ප්‍රාථමික මට්ටමේ එක් සේවකයෙකුද, තදුචිත පදනම යටතේ සේවකයින් 406 ක් හා කොන්ත්‍රාත් පදනම යටතේ සේවකයින් 140 ක් වශයෙන් සේවකයින් 546 දෙනෙකුද අධිකාරියේ කටයුතු සඳහා අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා සේවයේ යොදවාගෙන තිබුණි. | කාර්යය මණ්ඩලය අනුමත කරවා ගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබුවත් ඒ සඳහා කිසිදු පිළිතුරක් ලැබී නොමැත. | කාර්යය මණ්ඩලය අනුමත කරවා ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.2 පාසැල් කාර්ය මණ්ඩලය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විවිධ රෝග තත්වයන් මත පන්ති කාමර ඉගැන්වීමේ ක්‍රියාවලියෙන් බැහැරව සිටින හොරණ අධ්‍යාපන කලාපයට අදාළ ගුරුවරුන් 38 දෙනෙකු සඳහා 2021 වර්ෂයේ දී පමණක් එකතුව රු.16,927,860 ක් වැටුප් ලෙස ගෙවා තිබුණු අතර වැටුප් ගෙවීමේ අපේක්ෂිත අරමුණ ඉටුකර ගැනීමට හෝ එම ගුරුවරුන් සම්බන්ධයෙන් විධිමත් පියවර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසානයටත් බලධාරීන් කටයුතු කර නොතිබුණි. | එම ගුරුවරුන් සම්බන්ධයෙන් කටයුතු සිදු කරමින් පවතී. | විවිධ රෝග තත්ත්වයන් යටතේ කාමර ඉගැන්වීමේ ක්‍රියාවලියෙන් බැහැරව සිටින ගුරුවරුන් සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 3.3 සෞඛ්‍ය කාර්ය මණ්ඩලය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආයතන සංග්‍රහයේ III පරිච්ඡේදයට හා 2001 අගෝස්තු 22 දිනැති අංක18/2001 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව වසර 05කට වැඩි කාලයක් සපුරා ඇති නිළධාරීන් ස්ථාන මාරුවීම් සිදුකළ යුතු වුවද, මීරිගම මූලික රෝහලේ හා වතුපිටිවල රෝහලේ හෙද නිලධාරීන් 101 ක්ද, සෞඛ්‍ය නිලධාරීන් 50 ක්ද, කණිෂ්ඨ කාර්යය මණ්ඩලයේ නිලධාරීන් 23 ක්ද වසර 05 සිට 27 දක්වා කාල පරාසයක් තුළ සේවය කරමින් පැවතුණි. | කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් ස්ථාන මාරුවීම් සිදු නොවුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 සැලසුම් කිරීම

**ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 13 ඡේදය අනුව වාර්ෂික ක්‍රියාකාරී සැලස්ම, රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තු මාර්ගෝපදේශ අනුව සකස් කළ යුතු වුවත් බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයේ සමාලෝචිත වර්ෂයට අදාළ ක්‍රියාකාරී සැලැස්ම ඒ අනුව පිළියෙල කර නොතිබුණු අතර කාර්යාලයේ එක් අංශයක් පමණක් ආවරණය වන පරිදි අසම්පූර්ණව පිළියෙල කර තිබුණි. | අදහස් දක්වා නොමැත. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |